**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව**

**------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

විභාග දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 06 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් 07කට අදාලව ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර රු.118,280,504 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වන බව. | නොගැලපීම් සඳහා හේතු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු බව. |
| (ආ) මුද්‍රණ අංශය වෙත මිලදී ගනු ලැබූ රු.546,264,452 ක් වටිනා ටර්න් කී මුද්‍රණ යන්ත්‍රය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | අදහසක් දක්වා නැත. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 04 ක රු.129,600,000 ක සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | 2020 වාර්ෂික අයවැයේදී ආරම්භයේදී ප්‍රතිපාදන වෙන් නොවූ අතර අතුරු සම්මත ගිණුම යටතේ කාර්තුමය වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම කර ඇති බව. | නිසි අධ්‍යයනයකින් පසු ඇස්තමේන්තු සකස් කළ යුතු බව. |

**2.2** **හිඟ ආදායම්**

**--------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **----------------------** | **-----------------------------** | **-----------** |
| හිඟ විභාග ආදායම් ශේෂය වූ රු.1,509,792 ක් තුළ 2018 හා 2019 වර්ෂවලට අදාල රු.834,813 ක් ඇතුලත්ව තිබුණි. | එකඟ වන බව. | හිඟ හිටි ආදායම් රැස්කර ගැනීමට කටයුතු කිරීම. |

**2.3** **තැන්පතු**

**----------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **----------------------** | **-----------------------------** | **-----------** |
| 2020 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 04 ක රු.67,677,090 ක ශේෂය තුළ අවුරුදු 2-5 ත් අතර කාලයට අදාළ රු.4,974,354 ක ශේෂ ඇතුළත් වී තිබූ අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

**2.4** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **----------------------** | **------------------------** | **-----------** |
| (අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ප්‍රකාරව මුදල් වර්ෂයේ සියලුම බැරකම් එම මුදල් වර්ෂය තුලදී ගෙවා නිදහස් කළ | ලේඛන ගත කර ඇත. | යම් මුදල් වරෂයකට අදාල සියළුම බැරකම් එම මුදල් වර්ෂය තුලදී නිරවුල් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂයේ නිරවුල් කිරීමට ඉදිරියට ගෙන නොයායුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළව රු.13,173,163 ක බැඳිම් හා බැරකම් 2021 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | | |
| (ආ) | නිල නිවාස 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.17,820,562 ක් සමාලෝචිත වර්ෂයේ බැරකම්වල ඇතුලත් කර නොතිබුණි. | අතපසු වී ඇත. | බැරකම් ලේඛනයේ ඇතුලත් කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | මුදල් රෙගුලාසි 94 (i) | වැය විෂයයන් 08 ක් සඳහා ඉතිරිවීම් ඉක්මවා රු.10,157,120 ක බැරකම් සඳහා බැදීම් ඇති කරගෙන තිබුණි. | 2020 වර්ෂයේ ප්‍රතිපාදන කාර්තු පදනම මත ලබා දී ඇත. කර්තුවක් අවසානයේදී බැදිම් ඇතිකර තිබුණ ද ගෙවීම්කර නොතිබුනේ නම් ප්‍රතිපාදන අහෝසි වන බව. | ප්‍රතිපාදන තිබේ නම් පමණක් බැදීම් ඇති කර ගැනීම. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | 1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනතේ 6 (1) වගන්තිය | ප්‍රසිද්ධ විභාගයක ප්‍රශ්න පත්‍රයක් පිළිතුරු සැපයීම ආරම්භ වන වේලාවේ සිට පැය භාගයක් ඉකුත් වන තෙක් රහස් ලේඛනයක් වූ නමුත් දිවා කාලයේදී සියළුම බාහිර පාර්ශවයන්ට නිරාවරණය වන අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා (උසස් පෙළ) ප්‍රශ්න පත්‍ර එදින රාත්‍රී කාලයේ තවත් විභාග අපේක්ෂකයින් පිරිසක් වෙත පිළිතුරු සැපයීමට ලබා දී තිබුණි. | අයදුම්කරුවන් විභාග දින පෙ.ව.8.00 සිට විභාග දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයක් යටතේ රඳවා ගන්නා බැවින් බාහිර සමාජයට නිරාවරණය වීමක් සිදු නොවන බව. | පනත ප්‍රකාරව කටයුතු කිරීම. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST/07/EXAMS/05/2018 හා 2019 ඔක්තෝම්බර් 03 දිනැති ලිපියෙන් ප්‍රසිද්ධ විභාග කටයුතුවල නියැලෙන නිලධාරීන් සඳහා 2019 ඔක්තෝම්බර් 03 දින සිට ඉදිරි වර්ෂ 05 ක කාලයක් සඳහා අදාල කර | මෙම සංශෝධනයේ දී 2013 ගෙවීම් ලේඛනයේ ඇතුළත්ව තිබූ සමහර දීමනා අඩුවීම සහ සමහර දීමනා ඉවත්වීම හේතුවෙන් ඒ පිළිබඳ අභියාචනයක් ඉදිරිපත් | සංශෝධිත ගෙවීම් නිර්දේශ අනුව විභාග රාජකාරි සඳහා ගාස්තු ගෙවීම. |

| | | |
|---|---|---|
| | ගැනීමේ කොන්දේසි වලට යටත්ව ගාස්තු සංශෝධනය කර තිබුණි. එසේ වුවද අනුමත සංශෝධිත විභාග ගාස්තු ගෙවීම් නිර්දේශ 2020 දෙසැම්බර් 31 දින වන විට ද ක්‍රියාත්මක නොකර පැරණි ගාස්තු පොතට අනුව ගෙවීම් කර තිබුණි. | කර ඇත. මෙම අභියාචනයට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් පිළිතුරු ලැබෙන තෙක් 2013 ගාස්තු ලේඛනයට අදාළව ගෙවීම් කටයුතු සිදු කර ඇත. | |
| (ආ) | නව ගාස්තු පොත අනුව රහස්‍ය ලේඛන කටයුතු සඳහා ගෙවනු ලබන මාසික රහස්‍ය දීමනාව වර්ෂයට උපරිම මාස 06 ක් වුවද මාස 12 ක් සඳහා රු.628,456 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් අය කිරීමට කටයුතු යොදා ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---

බාහිර පාර්ශවයක ඉල්ලීමකට අනුව එක්තරා ආගමික ආයතනකට අයත් සිසුන් සුළු පිරිසකට පමණක් සබත් දින ලෙස සැලකෙන (සෙනසුරාදා) දිනවල දහවල ආගමික කටයුතු වල යෙදීමට අවස්ථාව සලසා දෙමින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගවල සෙනසුරාදාට යෙදෙන විෂයයන් සඳහා එදින රාත්‍රී කාලයේදී පෙනී සිටීමට අවස්ථාව ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ හෝ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් ලබා ගැනීමට හෝ දැනුවත් කිරීමට හෝ ක්‍රියා නොකර | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද විමර්ශනයකින් අනතුරුව විභාගය පැවැත්වීම නතර කරන ලෙස දැනුම් දී ඇති | විභාග පනත හා දෙපාර්තමේන්තු නිතී රීති ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | නීතිමය ප්‍රතිපාදන නොමැති සබත් දින විභාගය පැවැත්වීම අඛණ්ඩව වර්ෂ 50 ක පමණ කාලයක සිට සිදුකර තිබුණි. | බව | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) විද්‍යා විෂයයට අයත් ප්‍රශ්න පත්‍ර හා උත්තර පත්‍ර ශාලාධිපති විසින් විභාග පැවැත්වීමට ඉල්ලුම්කල ආයතනයට අයත් වාහනයකින් ප්‍රවාහනය කර තිබුණි. | අතීතයේ සිට විභාග පැවැත්වීමට ඉල්ලුම් කළ ආයතනය විසින් ප්‍රවාහන කටයුතු සඳහා වාහනයක් ලබා දී ඇත. | -එම- |
| (ඇ) | 2021 පෙබරවාරි 11 දිනැති 6/6 සා.පෙළ 2020 DP/OL/2020/08 දරන ශාලාධිපති සඳහා ඇති විශේෂ උපදෙස් ලිපිය මගින් කිසිඳු බාහිර පුද්ගලයකු විභාග මධ්‍යස්ථානයක් තුළ සිටිය නොහැකි වුවද පරිගණයක් යොදාගෙන සිසුන්හට ආගමික දර්ශන පෙන්වීම සඳහා බාහිර පුද්ගලයින් රැඳී සිටිමට ශාලාධිපති අවසර ලබා දී තිබුණි. | ආගමික වැඩසටහන් ක්‍රියාත්මක වූ පුද්ගලයා රැඳී සිට ඇත්තේ විභාග මධ්‍යස්ථානයේ නොව සිසුන් තාවකාලිකව රඳවා තබා සිටි ශාලාවේ විභාග කාර්ය මණ්ඩල සෘජු අධීක්ෂණ යටතේ බව. | -එම- |
| (ඈ) | මෙම විභාගයේ රාජකාරී වලට සහභාගී වූ දෙපාර්තමේන්තු නිලධාරින් විභාග රාජකාරි දීමනා ලෙස දෙපාර්තමේන්තු විභාග ගාස්තු පොතේ සඳහන් වටිනාකම මෙන් දෙගුණයක් බාහිර ආයතනයකින් පෞද්ගලිකව මුදලින් ලබා ගෙන තිබෙන බව අනාවරණය විය. | දිවා හා රාත්‍රී යන කාල දෙකෙහිම විභාග රාජකාරි කටයුතු වල නිරත විය යුතු බැවින් දෙගුණයක් සෘජුවම මුදලින් 1982 වර්ෂයේ පමණ සිට ගෙවා ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉකුත් වර්ෂයේදී සබත් දින අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් වූ අංක 19/IA/EX/05 දරන විශේෂ අභ්‍යන්තර විගණන වාර්තාව 2019 ජනවාරි 16 දින විභාග කොමසාරිස් ජනරාල් වෙත භාර දී තිබුණ ද එම විමර්ශන වාර්තාව පරිශිලනය කර අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | විමර්ශන වාර්තාව අනුව අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු බව. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2019 පෙබරවාරි අවසන් කිරීමට නියමිත කොන්ත්‍රාත් වටිනාකම රු.564,320,835 ක් වූ සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යංශයට රු.28,905,398 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.280,625,748 ක් ගෙවා තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි. | විවිධ හේතූන් මත ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇති බව. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට වැඩ අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 10.2 ජේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණු අතර 2019 වර්ෂයට අදාල වාර්තාව 2021 මාර්තු 31 දිනවන විට ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යය සාධන වාර්තාව 2019 හා 2020 වර්ෂවලට අදාලව මේ වන විට නිමාකර ඇති අතර ඉදිරියේ පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට කටයුතු සූදානම්ව පවතී. | චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසනියත්වය නංවාලීම හා රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රු.546,264,452 ක වියදමක් දරා ටර්න් කී මුද්‍රණ යන්ත්‍රය මිලදී ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී අ.පො.ස උසස් පෙළ ප්‍රශ්න පත්‍ර 346,180 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. එය සමස්ත ප්‍රශ්න පත්‍ර වලින් සියයට 5 ක තරම් අඩු ප්‍රතිශතයක් විය. | ප්‍රශ්නපත්‍ර ස්වභාවය අනුව පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට අපහසු වූ බව. | මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ අරමුණු ඉටු කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා රු.8,428,637ක් වටිනා ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස 2018 වර්ෂයේ මිලදීගෙන තිබුණ ද කිසිදු ප්‍රයෝජනයක් නොගෙන මිලදී ගත් දින සිට නිශ්කාර්යව තිබුණි. | එකඟ වෙමි. | කඩිනමින් වත්කම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) මුද්‍රණ යන්ත්‍රයේ හදිසි විදුලි බිඳ වැටීමකදී මුද්‍රණ පද්ධතිය ක්‍රියා විරහිත (shutdown) වන තුරු විදුලි සැපයුම පවත්වාගෙන යාම සඳහා පිරිවැය රු.7,096,000 ක් වූ කි.වෝ.160 ක "අඛණ්ඩ බලසැපයුම් ඒකකයක්" මිලදී ගෙන වසර 02 කට ආසන්න කාලයක් ගතවීමෙන් පසු ඒ සඳහා UPS කොටස මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිලදී ගැනීමේ පිරිවිතරවල මෙම අවශ්‍යතාවය සැලකිල්ලට නොගැනීම නිසා රු.මිලියන 7කට වැඩි මුදලක් අමතර වැය කිරීමට සිදු වී තිබුණි. | පැවති ලෙස දක්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු බව. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හානි ලේඛණයේ ඇතුලත් රු.616,740 ක අනතුරු අලාභයන් 03 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරි කටයුතු කෙරෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.630,000,000 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණ ද එම ඉඩම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු දන්වා ඇති බව. | පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) 2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැය කර ස්ථාපනය කර තිබුණු සූර්යබල ශක්ති පද්ධතියේ නිෂ්පාදන ධාරිතාවය හා පරිභෝජනය පිළිබඳ අපහැදිලිභාවය නිසා පත්කල දෙපාර්තමේන්තු කමිටුවේ 2018 ඔක්තෝබර් 08 දිනැති තීරණය | අධ්‍යයනයක් කෙරෙමින් පවතින බව. | කමිටු තීරණය අනුව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අනුව , සම්පූර්ණ විදුලි නිෂ්පාදනය විදුලි බල මණ්ඩලයට අලෙවි කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝදිත වර්ෂයේදී නිල නිවාස 03 ක් මිලදී ගැනීමට 2020 හා 2021 වර්ෂ වලදී නාගරික සංවර්ධන අධිකාරියට ගෙවියයුතු රු.31,700,936 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද ගෙවා නොතිබුණි. නියමිත දිනයන්හිදී ගෙවීමට අපොහොසත් වුවහොත් ගෙවීම් වලින් සියයට 25 ක් රඳවා ගෙන වෙන් කිරීම අවලංගු කිරීමට හෝ නිවාස සංවර්ධන අධිකාරී විසින් තීරණය කරනු ලබන ප්‍රමාද ගාස්තුවක් සියයට 12 ක වාර්ෂික පොළියක් ද සමඟ ගෙවීමට හෝ සිදුවන බව ගිවිසුම් කොන්දේසි 1.1 (B) හී සඳහන්ව තිබුණ ද මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බව. | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික අත්දැකීම් හා ක්‍රියාකාරකම් මැන බැලීම අරමුණු ඇතිව මාර්ගගත ක්‍රමයට 2018 වර්ෂයට අදාලව පවත්වන ලද තොරතුරු තාක්ෂණය (GIT) විභාගය ප්‍රතිඵල 2021 මාර්තු 31 දින දක්වාම ලබා දීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. එසේම ඒ සඳහා 2019 , 2020 හා 2021 වර්ෂ වලදී රු. 128,359,865 ක වියදමක්ද දරා තිබුණි. | විභාගයේ ප්‍රතිඵල සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඉ) | 1992 වර්ෂයේ සිට පැවති විභාගවල ප්‍රතිඵල සහතික පරිගණක පද්ධතිය හරහා නිකුත් කරන නමුත් 1992 වර්ෂයට පෙර පැවති විභාගවල ප්‍රතිඵල එසේ නිකුත් කිරීමට කටයුතු ආරම්භකර තිබුණ ද 2021 ජුනි දක්වා ප්‍රතිඵල නිකුත් කිරීමට හා සනාථ කිරීමට නොහැකි වී තිබුණි. | සහතික පරිලෝකනය කිරීම සඳහා වන ව්‍යාපෘතියේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත් ඉදිරියේදී ප්‍රතිඵල සනාථ කිරීම හා නැවත ප්‍රතිඵල නිකුත් කිරීම වේගවත්ව සිදු කිරීමට හැකි වන බව. | මාර්ගගත ක්‍රමයට ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**04.** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනියම් පදනමින් සේවය කල 82 දෙනෙකු සඳහා 2020 පෙබරවාරි 20 දින කා.කා.සේ III ශ්‍රේණියට ස්ථිර පත්වීම් ලබාදී ප්‍රාථමික මට්ටමට ඇතුලත් කර මාස 06 ක කාලයක් ස්ථිර වැටුප් ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද ඔවුන්ට ස්ථිර පත්වීම් ලබා දී නොතිබුණි. ඔවුන් අතුරින් සේවය හැර ගොස් ඇති 06 දෙනෙකුට ගෙවන ලද රු. 553,381 ක මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ කා.සේ.සේ/v16/රා.පරි.චක්‍ර/ 29/2019 හා 2021-02-18 දිනැති ලිපියේ උපදෙස් පරිදි තාවකාලික පත්වීම් ලිපි ලබා දුන්නද 2021-02-21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 බඳවා ගැනීම් අත්හිටුවා තිබීම. | ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. |
| (ආ) | 2021 වර්ෂයේදී ද අනියම් පදනමින් 15 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | විභාග ක්‍රියාත්මක වන කාලය තුල විශාල මෙහෙයුම් කටයුත්තක් සිදුවන බැවින් තාවකාලික පදනමින් බඳවා ගැනීමට සිදුව ඇති බව. | අනුමත සංඛ්‍යා නොඉක්මවන ලෙස බඳවා ගැනීම් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පවතින පුරප්පාඩු 152 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 12 ක් හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 12 ක් පැවතුණි. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු බව. |